# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,470 - 2026 ජනවාරි මස 02 වැනි සිකුරාදා - 2026.01.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශය ආදිය ... ... | — | රජයේ නිවේදන ... ... ... ... ... | |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | මිල පාලන දැන්වීම් ... ... ... ... ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | 02 | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... | 02 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... ... ... | 03 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — | නැවියන්ට දැන්වීම් ... ... ... ... ... | — |
| | — | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජනවාරි මස 23 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජනවාරි මස 09 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2025 ජුනි මස 09 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

01 - B 82751- (2026/01)
E - 01

## අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2026 අංක 01

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් මහා භාරකාර දෙපාර්තමේන්තුවේ මහා භාරකාර තනතුරේ සේවය කරනු ලබන මහාධිකරණ විනිසුරු ගිහාන් අරුණ බණ්ඩාර හේරත් පිලපිටිය මහතාගේ සේවා කාලය, 2025 දෙසැම්බර් මස 02 දින සිට ක්‍රියාත්මකවන පරිදි, තවත් එක් (01) වසරක කාලසීමාවක් සඳහා දීර්ඝ කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

ඩබ්ලිව්. එම්. ඩී. ජේ. ප්‍රනාන්දු,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2025 දෙසැම්බර් මස 23 වැනි දින.

01 - 16

---

## වෙනත් පත්කිරීම් ආදිය

2026 අංක 02

**ශ්‍රී ලංකා නිත්‍ය නාවික බලකාය**

නිලධාරින්ගේ උසස් කිරීම්

*2024 ජුනි මස 01 දින සිට වෛද්‍ය ලුතිනන් (දන්ත) වශයෙන්* :

උප ලුතිනන් සේනානායක රාලලාගේ මොදිත ඕවින්ද සේනානායක, එන්ආර්ඞී 4030, ශ්‍රීලංනාහ;

උප ලුතිනන් බෝදා හැන්නදිගේ මොන්ටි ජයනාත් සඳරුවන් ද සිල්වා, එන්ආර්ඞී 4492, ශ්‍රීලංනාහ;

*2024 පෙබරවාරි මස 19 දින සිට උප ලුතිනන් වශයෙන්* :

වැඩ බලන උප ලුතිනන් ඉරුගල් බණ්ඩාරලාගේ දර්ශ ඉරුගල්බණ්ඩාර, එන්ආර්එක්ස් 4497, ශ්‍රීලංනාහ;

වැඩ බලන උප ලුතිනන් රත්නායක මුදියන්සේලාගේ ඉසුරු කළණ බණ්ඩාර ඒකනායක, එන්ආර්එක්ස් 4502, ශ්‍රීලංනාහ;

*2025 මාර්තු මස 28 දින සිට උප ලුතිනන් (නාපාබල) වශයෙන්* :

වැඩ බලන උප ලුතිනන් (නාපාබල) හෙට්ටි ආරච්චිගේ ළහිරු නිම්සර, එන්ආර්අයි 4652, ශ්‍රීලංනාහ.

බීඡ්කේඑස්පී බානගොඩ,
ආර්එස්පී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී,
වයිස් අද්මිරාල්.
නාවික හමුදාධිපති.

2025 දෙසැම්බර් මස 15 දින,
කොළඹ දී ය.
01 - 02

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

පීවී 00246117.

**සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

2007 අංක 07 දරන සමාගම් පනත

**394(3) වගන්තිය යටතේ නාමය කපා හැරීමේ දැන්වීම**

***"සෙන්ෆින් රියල් එස්ටේට් (ප්‍රයිවට්) ලිමිටඩ්"***

2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වගන්තිය යටතේ "සෙන්ෆින් රියල් එස්ටේට් (ප්‍රයිවට්) ලිමිටඩ්" සමාගමෙහි නම රෙජිස්ටරයෙන් කපාහැර විසුරුවා හරිනු ලබන බවටවන දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2021.10.05" දින සංස්ථාපිත සමාගමක් වන "සෙන්ෆින් රියල් එස්ටේට් (ප්‍රයිවට්) ලිමිටඩ්" සමාගම ව්‍යාපාරය කරගෙන නොයන බව හෝ ක්‍රියාත්මකව නොමැති බව හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "සෙන්ෆින් රියල් එස්ටේට් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් *(වැ.බ.)* කළුදේව අරවින්ද ප්‍රියදර්ශනී ද සිල්වා වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

කළුදේව අරවින්ද ප්‍රියදර්ශනී ද සිල්වා,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් *(වැ.බ.)*.

අංක 400,
ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

01 - 05

---

පීවී 00262868.

**සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

2007 අංක 07 දරන සමාගම් පනත

**394(3) වගන්තිය යටතේ නාමය කපා හැරීමේ දැන්වීම**

***"රෙඩ් වෙරීස් ඉන්වෙස්ට්මන්ට්ස් (පීවීටී) එල්ටීඩී"***

2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වගන්තිය යටතේ "රෙඩ් වෙරීස් ඉන්වෙස්ට්මන්ට්ස් (පීවීටී) එල්ටීඩී" සමාගමෙහි නම රෙජිස්ටරයෙන් කපාහැර විසුරුවා හරිනු ලබන බවටවන දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2022.09.07" දින සංස්ථාපිත සමාගමක් වන "රෙඩ් වෙරීස් ඉන්වෙස්ට්මන්ට්ස් (පීවීටී) එල්ටීඩී" සමාගම ව්‍යාපාරය කරගෙන නොයන බව හෝ ක්‍රියාත්මකව නොමැති බව හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "රෙඩ් වෙරීස් ඉන්වෙස්ට්මන්ට්ස් (පීවීටී) එල්ටීඩී" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් *(වැ.බ.)* කළුදේව අරවින්ද ප්‍රියදර්ශනී ද සිල්වා වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

කළුදේව අරවින්ද ප්‍රියදර්ශනී ද සිල්වා,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් *(වැ.බ.)*.

අංක 400,
ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

01 - 06

---

පීවී 00282541.

**සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

2007 අංක 07 දරන සමාගම් පනත

**394(3) වගන්තිය යටතේ නාමය කපා හැරීමේ දැන්වීම**

***"ද ඕෂන් පර්ල් රිසෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්"***

2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වගන්තිය යටතේ "ද ඕෂන් පර්ල් රිසෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" සමාගමෙහි නම රෙජිස්ටරයෙන් කපාහැර විසුරුවා හරිනු ලබන බවට වන දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2023.08.16" දින සංස්ථාපිත සමාගමක් වන "ද ඕෂන් පර්ල් රිසෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" සමාගම ව්‍යාපාරය කරගෙන නොයන බව හෝ ක්‍රියාත්මකව නොමැති බව හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "ද ඕෂන් පර්ල් රිසෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් *(වැ.බ.)* කළුදේව අරවින්ද ප්‍රියදර්ශනී ද සිල්වා වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

කළුදේව අරවින්ද ප්‍රියදර්ශනී ද සිල්වා,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් *(වැ.බ.)*.

අංක 400,
ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

01 - 07

පීවී 00289578.

**සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

2007 අංක 07 දරන සමාගම් පනත

**394(3) වගන්තිය යටතේ නාමය කපා හැරීමේ දැන්වීම**

***"පීජ්එල් ෆවුන්ඩේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්"***

2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වගන්තිය යටතේ "පීජ්එල් ෆවුන්ඩේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්" සමාගමෙහි නම රෙජිස්ටරයෙන් කපාහැර විසුරුවා හරිනු ලබන බවට වන දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2023.12.01" දින සංස්ථාපිත සමාගමක් වන "පීජ්එල් ෆවුන්ඩේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්" සමාගම ව්‍යාපාරය කරගෙන නොයන බව හෝ ක්‍රියාත්මකව නොමැති බව හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "පීජ්එල් ෆවුන්ඩේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් *(වැ.බ.)* කළුදේව අරවින්ද ප්‍රියදර්ශනී ද සිල්වා වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

කළුදේව අරවින්ද ප්‍රියදර්ශනී ද සිල්වා,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් *(වැ.බ.)*.

අංක 400,
ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

01 - 08

---

පීවී 00260876.

**සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

2007 අංක 07 දරන සමාගම් පනත

**394(3) වගන්තිය යටතේ නාමය කපා හැරීමේ දැන්වීම**

***"අයිඅයි ඩිජිටල් මාර්කටින් (ප්‍රයිවට්) ලිමිටඩ්"***

2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වගන්තිය යටතේ "අයි අයි ඩිජිටල් මාර්කටින් (ප්‍රයිවට්) ලිමිටඩ්" සමාගමෙහි නම රෙජිස්ටරයෙන් කපාහැර විසුරුවා හරිනු ලබන බවට වන දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2022.07.25" දින සංස්ථාපිත සමාගමක් වන "අයිඅයි ඩිජිටල් මාර්කටින් (ප්‍රයිවට්) ලිමිටඩ්" සමාගම ව්‍යාපාරය කරගෙන නොයන බව හෝ ක්‍රියාත්මකව නොමැති බව හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "අයිඅයි ඩිජිටල් මාර්කටින් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් *(වැ.බ.)* කළුදේව අරවින්ද ප්‍රියදර්ශනී ද සිල්වා වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

කළුදේව අරවින්ද ප්‍රියදර්ශනී ද සිල්වා,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් *(වැ.බ.)*.

අංක 400,
ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

01 - 09

---

පීවී 00276623.

**සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

2007 අංක 07 දරන සමාගම් පනත

**394(3) වගන්තිය යටතේ නාමය කපා හැරීමේ දැන්වීම**

***"ඇක්වාබ්ලූ ඉන්ඩස්ට්‍රීස් (පීවීටී) එල්ටීඩී"***

2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වගන්තිය යටතේ "ඇක්වාබ්ලූ ඉන්ඩස්ට්‍රීස් (පීවීටී) එල්ටීඩී" සමාගමෙහි නම රෙජිස්ටරයෙන් කපාහැර විසුරුවා හරිනු ලබන බවට වන දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2023.05.18" දින සංස්ථාපිත සමාගමක් වන "ඇක්වාබ්ලූ ඉන්ඩස්ට්‍රීස් (පීවීටී) එල්ටීඩී" සමාගම ව්‍යාපාරය කරගෙන නොයන බව හෝ ක්‍රියාත්මකව නොමැති බව හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "ඇක්වාබ්ලූ ඉන්ඩස්ට්‍රීස් (පීවීටී) එල්ටීඩී" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් *(වැ.බ.)* කළුදේව අරවින්ද ප්‍රියදර්ශනී ද සිල්වා වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

කළුදේව අරවින්ද ප්‍රියදර්ශනී ද සිල්වා,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් *(වැ.බ.)*.

අංක 400,
ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

01 - 10

පීවී 128192.

**සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

2007 අංක 07 දරන සමාගම් පනත

**394(3) වගන්තිය යටතේ නාමය කපා හැරීමේ දැන්වීම**

***"ත්‍රී ස්ටාර්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්"***

2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වගන්තිය යටතේ "ත්‍රී ස්ටාර්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්" සමාගමෙහි නම රෙජිස්ටරයෙන් කපාහැර විසුරුවා හරිනු ලබන බවට වන දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2017.12.26" දින සංස්ථාපිත සමාගමක් වන "ත්‍රී ස්ටාර්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්" සමාගම ව්‍යාපාරය කරගෙන නොයන බව හෝ ක්‍රියාත්මකව නොමැති බව හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "ත්‍රී ස්ටාර්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් *(වැ.බ.)* කළුදේව අරවින්ද ප්‍රියදර්ශනී ද සිල්වා වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

කළුදේව අරවින්ද ප්‍රියදර්ශනී ද සිල්වා,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් *(වැ.බ.)*.

අංක 400,
ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

01 - 11

---

පීවී 119541.

**සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

2007 අංක 07 දරන සමාගම් පනත

**394(3) වගන්තිය යටතේ නාමය කපා හැරීමේ දැන්වීම**

***"ද ජාඩ් සී ෆුඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්"***

2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වගන්තිය යටතේ "ද ජාඩ් සී ෆුඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්" සමාගමෙහි නම රෙජිස්ටරයෙන් කපාහැර විසුරුවා හරිනු ලබන බවට වන දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2017.01.23" දින සංස්ථාපිත සමාගමක් වන "ද ජාඩ් සී ෆුඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්" සමාගම ව්‍යාපාරය කරගෙන නොයන බව හෝ ක්‍රියාත්මකව නොමැති බව හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "ද ජාඩ් සී ෆුඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් *(වැ.බ.)* කළුදේව අරවින්ද ප්‍රියදර්ශනී ද සිල්වා වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

කළුදේව අරවින්ද ප්‍රියදර්ශනී ද සිල්වා,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් *(වැ.බ.)*.

අංක 400,
ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

01 - 12

---

පීවී 131871.

**සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

2007 අංක 07 දරන සමාගම් පනත

**394(3) වගන්තිය යටතේ නාමය කපා හැරීමේ දැන්වීම**

***"අවිරාතේ කැෆේ (ප්‍රයිවට්) ලිමිටඩ්"***

2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වගන්තිය යටතේ "අවිරාතේ කැෆේ (ප්‍රයිවට්) ලිමිටඩ්" සමාගමෙහි නම රෙජිස්ටරයෙන් කපාහැර විසුරුවා හරිනු ලබන බවට වන දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2018.04.27" දින සංස්ථාපිත සමාගමක් වන "අවිරාතේ කැෆේ (ප්‍රයිවට්) ලිමිටඩ්" සමාගම ව්‍යාපාරය කරගෙන නොයන බව හෝ ක්‍රියාත්මකව නොමැති බව හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "අවිරාතේ කැෆේ (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් *(වැ.බ.)* කළුදේව අරවින්ද ප්‍රියදර්ශනී ද සිල්වා වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

කළුදේව අරවින්ද ප්‍රියදර්ශනී ද සිල්වා,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් *(වැ.බ.)*.

අංක 400,
ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

01 - 13

පීවී 103128.

**සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

2007 අංක 07 දරන සමාගම් පනත

**394(3) වගන්තිය යටතේ නාමය කපා හැරීමේ දැන්වීම**

***"හයි ස්ටාර් ක්ලීනර්ස් (පීවීටී) එල්ටීඩී"***

2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වගන්තිය යටතේ "හයි ස්ටාර් ක්ලීනර්ස් (පීවීටී) එල්ටීඩී" සමාගමෙහි නම රෙජිස්ටරයෙන් කපාහැර විසුරුවා හරිනු ලබන බවට වන දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2015.01.01" දින සංස්ථාපිත සමාගමක් වන "හයි ස්ටාර් ක්ලීනර්ස් (පීවීටී) එල්ටීඩී" සමාගම ව්‍යාපාරය කරගෙන නොයන බව හෝ ක්‍රියාත්මකව නොමැති බව හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "හයි ස්ටාර් ක්ලීනර්ස් (පීවීටී) එල්ටීඩී" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් *(වැ.බ.)* කළුදේව අරවින්ද ප්‍රියදර්ශනී ද සිල්වා වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

කළුදේව අරවින්ද ප්‍රියදර්ශනී ද සිල්වා,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් *(වැ.බ.)*.

අංක 400,
ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

01 - 14

---

පීවී 110652.

**සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

2007 අංක 07 දරන සමාගම් පනත

**394(3) වගන්තිය යටතේ නාමය කපා හැරීමේ දැන්වීම**

***"සොඩියැක් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්"***
***පැරණි නාමය "ජෙරමියා ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්"***

2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වගන්තිය යටතේ "සොඩියැක් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්" සමාගමෙහි නම රෙජිස්ටරයෙන් කපාහැර විසුරුවා හරිනු ලබන බවට වන දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2015.12.21" දින සංස්ථාපිත සමාගමක් වන "සොඩියැක් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්" සමාගම ව්‍යාපාරය කරගෙන නොයන බව හෝ ක්‍රියාත්මකව නොමැති බව හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "සොඩියැක් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් *(වැ.බ.)* කළුදේව අරවින්ද ප්‍රියදර්ශනී ද සිල්වා වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

කළුදේව අරවින්ද ප්‍රියදර්ශනී ද සිල්වා,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් *(වැ.බ.)*.

අංක 400,
ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

01 - 15

---

**කාර්ගිල්ස් බැන්ක් පීඑල්සී (පෙර කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ්) - ආයතනික ශාඛාව**

1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගණුදෙනුකරුගේ නම : උඩුගම ගමගේ ජයනි ඉන්දු උඩුගම

ලියාපදිංචි අංක PQ00293614 දරන කාර්ගිල්ස් බැන්ක් පීඑල්සී (ලියාපදිංචි අංක PB 4847 දරන කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් ලෙස පෙර හැඳින්වූ) හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2025.07.11 දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම් උඩුගම ගමගේ ජයනි ඉන්දු උඩුගම උකස්කරු වශයෙන් කොළඹ 03, ගාලු පාර, නො. 696 හි ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටි කාර්ගිල්ස් බැන්ක් පීඑල්සී (මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) නමට ප්‍රසිද්ධ නොතාරිස් ඒ. සී. නදීෂා විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2018.07.26 දිනැති අංක 431 දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රය උකස් කොට බැඳ තබා ප්‍රදානය කරන ලද ණය පහසුකම මත ගෙවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී අංක 431 දරන උකස් බැඳුම්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් 2024.12.31 දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන්, රුපියල් දෙකෝටි අසූහතර ලක්ෂ දාහත් දහස් තුන්සිය දොළහයි ශත හතළිස් පහ (රු. 28,417,312.45) මුදලක් සහ එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා

නිම කරනු ලබන තෙක් 2025.01.01 දින සිට රු. 21,140,005.36ක මුදල මත වර්ෂයකට 15%ක පොළියක් ද, බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ.

ඒ කෙසේ ද යත්,

එකී අංක 431 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් දෙකෝටි අසූහතර ලක්ෂ දාහත් දහස් තුන්සිය දොළහයි ශත හතළිස් පහ (රු. 28,417,312.45) මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද (ඒ වන විට යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩු කොට) අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උඩුගම ගමගේ ජයනි ඉන්දු උඩුගම උකස්කරු වශයෙන් උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 182/3 (50/3) හි බලපත්‍රලාභී වෙන්දේසිකරු, තුසිත් කරුණාරත්න වෙත වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, උඩුගහ පත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පිහිටි මදුව්ට එගොඩ නිට්ටඹුව ග්‍රාම සේවා වසමේ නිට්ටඹුව ග්‍රාමයේ පිහිටි "මීගහලන්ද, මීගහවත්ත *නොහොත්* කෝන්ගහවත්ත" දරන ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. එන්. ඒ. ඩබ්ලිව්. සූරියආරච්චි විසින් මැන සාදන ලද අංක 3226 හා 2007 අප්‍රේල් මස 08 දින දරන පිඹුරේ කැබලි අංක 1A දරන කොටසට මායිම් : උතුරට : ආර්. ඒ. එල්. රණසිංහ, ඩබ්ලිව්. සීමන් සහ තවත් අයට අයත් ඉඩම් සහ නැගෙනහිරට: අංක 3226 දරන පිඹුරේ කැබලි අංක 1B සහ 1C සහ දකුණට : අංක 31 දරන පිඹුරේ කැබලි අංක 2 සහ බස්නාහිරට : ජයසිරි ගෝමස්ට අයත් ඉඩම ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විස්ස (පර්. 20ක්) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු, බිම ඇතුළු අංක 3226 දරන පිඹුරේ සඳහන් සියලු දේ ඇත. මෙය අත්තනගල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වෙළුම/ පත්ඉරුව B171/97 හි ලියාපදිංචි වී ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, උඩුගහ පත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පිහිටි මදුව්ට එගොඩ නිට්ටඹුව ග්‍රාම සේවා වසමේ නිට්ටඹුව ග්‍රාමයේ පිහිටි "මීගහලන්ද, මීගහවත්ත *නොහොත්* කෝන්ගහවත්ත" දරන ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. එන්. ඒ. ඩබ්ලිව්. සූරියආරච්චි විසින් මැන සාදන ලද අංක 3226 හා 2007 අප්‍රේල් මස 08 දින දරන පිඹුරේ කැබලි අංක 1B දරන කොටසට මායිම් : උතුරට : එකී අංක 3226 දරන පිඹුරේ කැබලි අංක 1C (පාර) සහ නැගෙනහිරට : ප්‍රාදේශීය සභා පාර සහ දකුණට : අංක 31 දරන පිඹුරේ කැබලි අංක 2 සහ බස්නාහිරට : එකී අංක 3226 දරන පිඹුරේ කැබලි අංක 1A ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දොළහයි දශම පහයි බිංදුව (පර්. 12.50)ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පලතුරු, බිම ඇතුළු අංක 3226 දරන පිඹුරේ සඳහන් සියලු දේ වේ. මෙය අත්තනගල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වෙළුම/ පත්ඉරුව B369/94 හි ලියාපදිංචි වී ඇත.

**පහත සඳහන් ඉඩම් කොටසේ මාර්ග ප්‍රවේශය ද සමග**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, උඩුගහ පත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පිහිටි මදුව්ට එගොඩ නිට්ටඹුව ග්‍රාම සේවා වසමේ නිට්ටඹුව ග්‍රාමයේ පිහිටි "මීගහලන්ද, මීගහවත්ත *නොහොත්* කෝන්ගහවත්ත" දරන ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. එන්. ඒ. ඩබ්ලිව්. සූරියආරච්චි විසින් මැන සාදන ලද අංක 3226 හා 2007 අප්‍රේල් මස 08 දින දරන පිඹුරේ කැබලි අංක 1C දරන (අඩි 10 පළල පාර) දරන කොටසට මායිම් : උතුරට: ඩබ්ලිව්. සීමන් සහ තවත් අයට අයත් ඉඩම් සහ නැගෙනහිරට : ප්‍රාදේශීය සභා පාර ද; දකුණට : එකී අංක 3226 දරන පිඹුරේ කැබලි අංක 1B ද; බස්නාහිරට : එකී අංක 3226 දරන පිඹුරේ කැබලි අංක 1A ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තුනයි දශම පහයි බිංදුව (පර්. 3.50ක්) විශාල අංක 3226 දරන පිඹුරේ සඳහන් ප්‍රවේශ මාර්ගය. මෙය අත්තනගල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව B180/47 හි ලියාපදිංචි වී ඇත.

චමිලා අබේසූරිය,<br>ප්‍රධානී - ණය අයකර ගැනීම්.

01 - 34

---

**කාර්ගිල්ස් බැන්ක් පීඑල්සී (පෙර කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ්) - ආයතනික ශාඛාව**

1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගණුදෙනුකරුගේ නම : ෂමීමා ෆර්වීන් ඔබෙයිඩ්

ලියාපදිංචි අංක PQ00293614 දරන කාර්ගිල්ස් බැන්ක් පීඑල්සී (ලියාපදිංචි අංක PB 4847 දරන කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් ලෙස පෙර හැඳින්වූ) හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2025.07.11 දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම් ෂමීමා ෆර්වීන් ඔබෙයිඩ් ණය ගැනුම්කරු වශයෙන් කොළඹ 3, ගාලු පාර, අංක 696 හි ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටි කාර්ගිල්ස් බැන්ක් පීඑල්සී (මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) නමට ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. එස්. පී. කේ. සුබසිංහ විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2020.08.31 දිනැති අංක 461 දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රය උකස් කොට බැඳ තබා ප්‍රදානය කරන ලද ණය පහසුකම මත ගෙවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී අංක 461 දරන උකස් බැඳුම්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් 2024.02.29 දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් එක්කෝටි හැත්තෑහය ලක්ෂ හතළිස්හත් දහස් අටසිය අනූහයයි ශත විස්සක (රු. 17,647,896.20) මුදලක් සහ එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරනු ලබන දිනය තෙක් 2024.03.01 දින සිට රු. 13,679,533.01ක මුදල මත වර්ෂයකට 17%ක පොළියක් ද;

සහ

සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් 2024.02.29 දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් විසිහතර ලක්ෂ දහතුන් දහස් නවසිය විසිඅටයි ශත පනස්හය (රු. 2,413,928.56) මුදලක් සහ එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරනු ලබන තෙක් 2024.03.01 දින සිට රු. 1,861,511.82 ක මුදල මත වර්ෂයකට 17.50%ක පොළියක් ද, බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ.

ඒ කෙසේ ද යත්,

එකී අංක 461 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් දෙකෝටි හැටඑක් දහස් අටසිය විසිහතරයි ශත හැත්තෑ හය (රු. 20,061,824.76) මුදල ඉහත කී දිනයන් හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද (ඒ වන විට යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩු කොට) අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත ෂමීමා ෆර්වීන් ඔබෙයිඩ් ණය ගැනුම්කරු වශයෙන් උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 182/3 (50/3) හි බලපත්‍රලාභි වෙන්දේසිකරු, තුසිත් කරුණාරත්න වෙත වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහනගර සභා බලප්‍රදේශයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි අංක 477A, තලංගම උතුර ග්‍රාම සේවා වසමේ, තලංගම උතුර සූරිය මාවත, වරිපනම් අංක 117 පිහිටි "අලුපොතේවත්ත *නොහොත්* අලුබෝගහවත්ත" දරන ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් මැන සාදන ලද අංක 11785 හා 2020 ජුනි මස 11 දින දරන පිඹුරේ කැබලි අංක 1A දරන කොටසට මායිම්: උතුරට : සූරිය මාවත සහ නැගෙනහිරට : පුද්ගලික පාර සහ දකුණට : සූරිය මාවත, වරිපනම් අංක 113/8 පරිශ්‍රය සහ බස්නාහිරට : පුද්ගලික පාර ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් හයයි දශම හතරයි බිංදුව (පර්. 6.40) හෝ හෙක්ටෙයාර් 0.0162ක් විශාල ඉඩම සහ එහි පිහිටි නිවස, බිම, ගහකොළ, පලතුරු ඇතුළු ඉහත කී අංක 11785 දරන පිඹුරේ සඳහන් සියලු දේ වේ.

### ඉඩම පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩමේ නැවත මිනුමකි

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහනගර සභා බලප්‍රදේශයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි අංක 477A, තලංගම උතුර ග්‍රාම සේවා වසමේ, තලංගම උතුර දැනට සූරිය මාවත, වරිපනම් අංක 117 පිහිටි "අලුපොතේවත්ත *නොහොත්* අලුබෝගහවත්ත" දරන ඉඩමට බලයලත් මිනින්දෝරු සී. ද එස්. ගුණතිලක විසින් මැන සාදන ලද අංක 2395 හා 1995 ඔක්තෝබර් මස 15 දින දරන පිඹුරේ කැබලි අංක 01 දරන කොටසට මායිම්: උතුරට : සූරිය මාවත සහ නැගෙනහිරට : අඩි 10 පළල පාර සහ දකුණට : කොස්වත්ත පාර, වරිපනම් අංක 472/64 පරිශ්‍රය සහ බස්නාහිරට : සොනි ප්‍රනාන්දුගේ ඉඩම යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් හයයි දශම හතරයි බිංදුව (පර්. 06.40) ක් විශාල ඉඩම සහ එහි පිහිටි නිවස, බිම, ගහකොළ, පලතුරු, ගොඩනැගිලි ඇතුළු ඉහත කී අංක 2395 දරන පිඹුරේ සඳහන් සියලු දේ වේ. මෙය හෝමාගම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වෙළුම/පත්‍රය B 1368/05 හි ලියාපදිංචි වී ඇත.

චමිලා අබේසූරිය,
ප්‍රධානී - ණය අයකර ගැනීම්.

01 - 36

---

### මහජන බැංකුව - අක්වෙරළ බැංකුකරණ ඒකකය (798) - ආයතනික බැංකුකරන අංශය (004)

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය ප්‍රකාර අධ්‍යක්ෂ මණ්ඩල තීරණය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඇ වගන්තිය අනුව, 2025.12.18 දින පැවැත්වූ රැස්වීමේ දී මහජන බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ඇති බව දැනුම් දෙනු ලැබේ.

එහිදී, 2007 අංක 07 දරන සමාගම් පනත අනුව නිසි ලෙස සංස්ථාපිත, ලියාපදිංචි අංක PV 18184 දරන, කොළඹ 03, ගාලු පාර, අංක 265 හි ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ලංකා හොටෙල්ස් ඇන්ඩ් රෙසිඩෙන්සීස් (පුද්ගලික) සමාගම විසින්, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එන්. එම්. හේවාජුලිගේ විසින් ලියා සහතික කරන ලද අංක 1640 සහ 2017 ජනවාරි මස 10 දිනැති ප්‍රාථමික සමගාමී උකස් බැඳුම්කරය සහ අංක 1832 සහ 2019 නොවැම්බර් මස 15 දිනැති ප්‍රාථමික සමගාමී උකස් බැඳුම්කරය යටතේ පිළිවෙලින් ජාතික සංවර්ධන බැංකුව සහ මහජන බැංකුව වෙත මුදල් ගෙවීමේ වගකීම පැහැර හැර ඇති බවත්, ඒ අනුව මේ වන විට මහජන බැංකුව වෙත ගෙවිය යුතු මුළු මුදල ලෙස, එක්සත් ජනපද ඩොලර් මිලියන විසි දෙකයි නව ලක්ෂ හැත්තෑ නව දහස් එකසිය හැත්තෑ නවයයි ශත තිහ (එ.ජ.ඩො. 22,979,179.30)ක මුදලක් පවතින බවත්, එම මුදල, එක්සත් ජනපද ඩොලර් මිලයන දහ හතරයි හත් ලක්ෂ අනූදහස් එකසිය හැට නවයයි ශත දහ අටක් (එ.ජ.ඩො. 14,790,169.18) වන මුල් මුදල හා 2025.12.10 දක්වා උපචිත පොළිය ලෙස එක්සත් ජනපද ඩොලර් මිලියන අටයි එක් ලක්ෂ අසූ නව දහස් දහයයි ශත දොළහක (එ.ජ.ඩො. 8,189,010.12) මුදලකින් සමන්විත වන බවත්, එමෙන් ම, එම බැඳුම්කර සම්බන්ධයෙන් 2025.12.11 සිට ඉදිරියට ද අමතර පොළී සමග රුපියල් බිලියන දෙකයි මිලියන දෙසිය දහ නවයයි හයලක්ෂ දහ හත් දහස් අටසිය හතරයි ශත අටක (රු. 2,219,617,804.08)ක මුදලක් ද ගෙවිය යුතු බවත්, එම මුදල රුපියල් බිලියන එකයි මිලියන එකසිය හතළිස් අටයි හත් ලක්ෂ අනූ අට දහස් හාරසිය විසි හයයි ශත විසි තුනක (රු. 1,148,798,426.23) වන මුල් මුදල සහ 2025.12.10 දක්වා උපචිත පොළිය ලෙස රුපියල් බිලියන එකයි මිලියන හැත්තෑවයි අටලක්ෂ දහ නව දහස් තුන්සිය හැත්තෑ හතයි ශත අසූ පහක (රු. 1,070,819,377.85)ක මුදලකින් සමන්විත වන බවත්, මෙයින් දන්වා සිටිමු.

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ ප්‍රතිපාදන අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පවරා ඇති බලතල යටතේ, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එන්. එම්. හේවාජුලිගේ විසින් ලියා සහතික කරන ලද අංක 1640 සහ 2017 ජනවාරි 10 දිනැති ප්‍රාථමික සමගාමී උකස් බැඳුම්කරය සහ අංක 1832 සහ 2019 නොවැම්බර් 15 දිනැති ප්‍රාථමික සමගාමී උකස් බැඳුම්කරය යටතේ මෙම බැංකුවට උකස් කර ඇති මෙහි පළමු හා දෙවන උපලේඛනවල වඩාත් විස්තර කර ඇති දේපළ හා පරිශ්‍රය, ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් විකිණීමට, හෝකන්දර, හෝකන්දර දකුණ, අංක 391/1 හි පදිංචි නවින්ද තුෂාර බෙන්ජමින් ද අල්විස් සමරවික්‍රම සහ ගල්කිස්ස, ශාන්ත රීටා පාර, අංක 61 හි පදිංචි අනුජ ඉන්දික ලෙනාර්ඩ් ද අල්විස් සමරවික්‍රම යන අය විසින් "ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම" යන නාමයෙන් සහ ව්‍යාපාරික ශෛලියෙන් හවුල් ව්‍යාපාරයක් ලෙස කටයුතු කරන, කොළඹ 08, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩන්ස්, අංක 6A හි ලියාපදිංචි බලපත්‍රලාභී වෙන්දේසිකරු ෂොක්මන් සහ සමරවික්‍රම වෙත පවරා පහත සඳහන් ණය මුදල් අයකර ගැනීම සඳහා, මෙයින් තීරණය කර ඇත.

i. 2025.12.11 සිට විකුණුම් දිනය දක්වා එක්සත් ජනපද ඩොලර් මිලියන දහහතරයි එක්ලක්ෂ අනූදහස් දහය (එ.ජ.ඩො. 14,190,010/-)ක් මත කාර්තු වශයෙන් නැවත මිලකරණයට යටත්ව, Three Months Security Overnight Funding Rate + වාර්ෂික 8% (SOFR + 8% වාර්ෂික) අනුපාතයට අමතර පොළියක් සමග එක්සත් ජනපද ඩොලර් මිලියන විසි දෙකයි විසි අට දහස් හැත්තෑ හයයි ශත දහහතක (එ.ජ.ඩො. 22,028,076.17) මුදල හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් එයට සමාන මුදලක්,

ii. 2025.12.11 සිට විකුණුම් දිනය දක්වා එක්සත් ජනපද ඩොලර් හයලක්ෂ එකසිය පනස් නවයයි ශත දහඅටක් (එ.ජ.ඩො. 600,159.18) මත කාර්තු වශයෙන් නැවත මිලකරණයට යටත්ව, Three Months Security Overnight Funding Rate + වාර්ෂික 8% (SOFR + 8% වාර්ෂික) අනුපාතයට අමතර පොළියක් සමග එක්සත් ජනපද ඩොලර් නව ලක්ෂ පනස් එක් දහස් එකසිය තුනයි ශත දහතුනක (එ.ජ.ඩො. 951,103.13)ක මුදල හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් එයට සමාන මුදලක්,

iii. 2025.12.11 සිට විකුණුම් දිනය දක්වා රුපියල් බිලියන එකයි මිලියන අසූ හතරයි පනස් දහසක (රු. 1,084,050.00) මුදල මත මාසිකව නැවත මිලකරණයට යටත්ව, සතිපතා සාමාන්‍ය බරිත ප්‍රමුඛ ණය අනුපාතිකය (Weekly Average Weighted Prime Lending Rate) + වාර්ෂික 5.5% වාර්ෂික) අනුපාතයට අමතර පොළියක් සමග රුපියල් බිලියන දෙකයි මිලියන අනූ එකයි පන් ලක්ෂ හතළිස් හතර දහස් එකසිය අසූ නවයයි ශත දහනවයක (රු. 2,091,544,189.19) මුදලක්,

iv. 2025.12.11 සිට විකුණුම් දිනය දක්වා රුපියල් මිලියන හැට හතරයි හත්ලක්ෂ හතළිස් අට දහස් හාරසිය විසිහයයි ශත විසි තුනක (රු. 64,748,426.23) මුදල මත මාසිකව නැවත මිලකරණයට යටත්ව, සතිපතා සාමාන්‍ය බරිත ප්‍රමුඛ ණය අනුපාතිකය (Weekly Average Weighted Prime Lending Rate) + වාර්ෂික 5.5% (AWPLR + 5.5% වාර්ෂික) අනුපාතයට අමතර පොළියක් සමග රුපියල් මිලියන එකසිය විසිඅටයි හැත්තෑතුන් දහස් හයසිය දහහතරයි ශත අසූ නවයක (රු. 128,073,614.89) මුදලක්,

සහ එම මහජන බැංකු පනතේ (29ඕ) වගන්තිය යටතේ අයකර ගත හැකි වියදම් සහ මුදල්, ලැබුණු ගෙවීම් (ඇත්නම්) අඩු කිරීමෙන් පසු වේ.

**පළමු උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහා නගර සභා සීමාව තුළ අංක 37, කොල්ලුපිටිය, වරිපනම්

අංක 265, 265/15, 265/40, 265/25, 265/27 සහ 265/21, ගාලු පාර පිහිටි ඉසබෙල් කෝර්ට් නැමති ඉඩමට (කේ. ඩී. ෆීලික්ස් ආර්. පෙරේරා වරලත් මානක විසින් මැන සාදන ලද අංක 2907 සහ 2012.03.27 දින දරන පිඹුර ප්‍රකාර ලොට් ඒ *නොහොත්* අයි. ඒ. විජේතිලක වරලත් මානක විසින් මැන සාදන ලද අංක 2934 සහ වර්ෂ 2012.07.16 දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කළ ලොට් ඒ සහ එම වරලත් මානක විසින්ම මැන සාදන ලද අංක 3104 සහ වර්ෂ 2013.12.18 දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කළ ලොට් 1 නැවත මැන ඒකාබද්ධ කරමින්) අයි. ඒ. විජේතිලක වරලත් මානක විසින් මැන සාදන ලද අංක 3105 සහ වර්ෂ 2013.12.20 දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කළ ලොට් 1 දරන කොටසට මායිම්,

*උතුරට* : පුද්ගලික පාර ද;
*නැගෙනහිරට* : ලිබර්ටි ප්ලාසා පරිශ්‍රය ද;
*දකුණට* : නිහාල් විජේසිංහ යන අය විසින් හිමිකම් කියන ඉඩම සහ පුද්ගලික පාර (කේ. කිද්නපිල්ලේ වරලත් මානක විසින් සකස් කරන ලද අංක 2420 සහ 1978.11.09 දිනැති පිඹුර ප්‍රකාර ලොට් ඊ) ද;
*බස්නාහිරට* : ගාලු පාර (කොල්ලුපිටිය පාර) ද;

යන මායිම් තුළ පිහිටි ඉහත කී 3105 පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් බිංදුවයි දශම තුනයි එකක් (රූ.3, පර්. 0.31) *හෙවත්* හෙක්ටයාර බිංදුවයි දශම තුනයි බිංදුවයි හතරයි තුනයි එකක් (හෙ. 0.30431) විශාල ඉඩම වේ.

ඉහත කී දේපළ පහත සඳහන් ඉඩම් කොටස් ඒකාබද්ධ කරමින් සකස් කර ඇත.

(i) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහා නගර සභා සීමාව තුළ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කොල්ලුපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ අංක 37, කොල්ලුපිටිය පිහිටි වරිපනම් අංක 265 සහ 265/15, ගාලු පාර දරන ඉසබෙල් කෝර්ට් නැමති ඉඩමට කේ. ඩී. එෆ්. ආර්. පෙරේරා වරලත් මානක විසින් මැන සාදන ලද අංක 2907 සහ 2012.03.27 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් ඒ දරන කොටසට මායිම් : උතුරට : පුද්ගලික පාර ද; නැගෙනහිරට: ගාලු පාරේ වරිපනම් අංක 265/21 දරන දේපළ සහ පුද්ගලික පාර (කේ. කිද්නපිල්ලේ වරලත් මානක විසින් සකස් කරන ලද අංක 2420 සහ 1978.11.09 දිනැති පිඹුර ප්‍රකාර ලොට් ඊ)ද; දකුණට : පුද්ගලික පාර (කේ. කිද්නපිල්ලේ වරලත් මානක විසින් සකස් කරන ලද අංක 2420 සහ 1978.11.09 දිනැති පිඹුර ප්‍රකාර ලොට් ඊ) ද; බස්නාහිරට: ගාලු පාර (කොල්ලුපිටිය පාර) ද, යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් දොළහයි දශම හතයි පහක් (රූ.2, පර්. 12.75) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සියලු දේ ද සමග වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරු ඊ 15/94 හි ලියාපදිංචි වී ඇත.

(ii) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහා නගර සභා සීමාව තුළ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කොල්ලුපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ අංක 37, කොල්ලුපිටිය පිහිටි වරිපනම් අංක 265/25, 265/27 සහ 265/40, ගාලු පාර දරන ඉසබෙල් කෝර්ට් නැමති ඉඩමට අයි. ඒ. විජේතිලක වරලත් මානක විසින් මැන සාදන ලද අංක 2934 සහ 2012.07.16 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් ඒ දරන කොටසට මායිම් : උතුරට : පුද්ගලික පාර ද; නැගෙනහිරට : ලිබර්ටි ප්ලාසා පරිශ්‍රය ද; දකුණට: නිහාල් විජේසිංහ විසින් හිමිකම් කියන ඉඩම සහ පාර (කේ. කිද්නපිල්ලේ වරලත් මානක විසින් සකස් කරන ලද අංක 2420 සහ 1978.11.09 දිනැති පිඹුර ප්‍රකාර ලොට් ඊ) ද; බස්නාහිරට : ගාලු පාරේ වරිපනම් අංක 265/21 දරන දේපළ ද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම හතයි පහක් (පර්. 20.75) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුලු සියලු දේ ද සමග වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරු ඊ 15/95 හි ලියාපදිංචි වී ඇත.

(iii) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහා නගර සභා සීමාව තුළ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කොල්ලුපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ අංක 37, කොල්ලුපිටිය පිහිටි වරිපනම් අංක 265/21, කොල්ලුපිටිය පාර දරන කොල්ලුපිටිය පාරේ පිහිටි පී. සින්නතම්බි වරලත් මානක විසින් මැන සාදන ලද අංක 4085 සහ 1993.07.19 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් "බීසී3" දරන කොටසට මායිම් : උතුරට : කොල්ලුපිටිය පාරේ, වරිපනම් අංක 263 දරන පරිශ්‍රය ද; නැගෙනහිරට : කොල්ලුපිටිය පාරේ, වරිපනම් අංක 265/65 දරන පිඹුරු අංක 2420 හි ලොට් ඩී පරිශ්‍රය ද; දකුණට : පිඹුරු අංක 2420 හි ලොට් ඊ (අඩි 20ක් පළල මාර්ගය සඳහා වෙන්කළ) (අනුමත පුද්ගලික පාර) ද; බස්නාහිරට : පිඹුරු අංක 4085 හි ලොට් බීසී2 ද, යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් බිංදුවයි හයයි දශම නවයයි බිංදුවක් (පර්. 06.90) *හෙවත්* හෙක්ටයාර 0.0175 විශාල ඉඩම වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරු ඊ 16/128 හි ලියාපදිංචි වී ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහා නගර සභා සීමාව තුළ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කොල්ලුපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ අංක 37, කොල්ලුපිටිය පිහිටි වරිපනම් අංක 265/42, 265/47, 267/7, 267/9, 267/3 සහ 3A සහ

267/5, ගාලු පාර දරන ඉසබෙල් කෝර්ට් නැමති ඉඩමට අයි. ඒ. විජේතිලක වරලත් මානක විසින් මැන සාදන ලද අංක 2932 සහ 2012.07.16 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් ඒ දරන කොටසට මායිම් : උතුරට : පාර (කේ. කිද්නපිල්ලේ වරලත් මානක විසින් සකස් කරන ලද අංක 2420 සහ 1978.11.09 දිනැති පිඹුර ප්‍රකාර ලොට් ඊ) ද; නැගෙනහිරට : නිහාල් විජේසිංහ විසින් හිමිකම් කියන ඉඩම සහ වරලත් මානක ඩබ්. එම්. පෙරේරා විසින් සකස් කළ අංක 1418 සහ 1974.11.10 දිනැති පිඹුර ප්‍රකාර ලොට් එල් ද; දකුණට : පාර (වරලත් මානක ඩබ්. එම්. පෙරේරා විසින් සකස් කළ අංක 1418 සහ 1974.11.10 දිනැති පිඹුර ප්‍රකාර ලොට් ආර් 1 සහ ආර්2) ද; බස්නාහිරට: ගාලු පාරේ වරිපනම් අංක 267 දරන දේපළ සහ පාර (කේ. කිද්නපිල්ලේ වරලත් මානක විසින් සකස් කරන ලද අංක 2420 සහ 1978.11.09 දිනැති පිඹුර ප්‍රකාර ලොට් ඊ) ද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් හතයි දශම හතයි නවයක් (රූ.1, පර්. 37.79) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුලු සියලු දේද සමග වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු ඊ 15/96 හි ලියාපදිංචි වී ඇත.

පහත සඳහන් ඉඩම් මතින් වන මාර්ග අයිතිය.

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහා නගර සභා සීමාව තුළ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කොල්ලුපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ අංක 37, කොල්ලුපිටිය පිහිටි ඩබ්. එම්. පෙරේරා වරලත් මානක විසින් මැන සාදන ලද අංක 1418 සහ 1974.11.10 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් ආර්1 (මාර්ගය සඳහා වෙන්කළ) දරන කොටසට මායිම් : උතුරට : ලොට් බී, ඩී, එෆ් සහ එච් ද; නැගෙනහිරට: ලොට් ආර් 2 (අඩි 20ක් පළල මාර්ගය සඳහා වෙන්කළ) ද; දකුණට : ලොට් ඒ, සී, ඊ සහ ජී ද; බස්නාහිරට : කොල්ලුපිටිය පාර ද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් අටයි දශම එකයි හයක් (පර්. 38.16) විශාල ඉඩම වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු ඒ 1064/262 හි ලියාපදිංචි වී ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහා නගර සභා සීමාව තුළ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කොල්ලුපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ අංක 37, කොල්ලුපිටිය පිහිටි හයි ක්‍රොස් නැමති ඉඩමට ඩබ්. එම්. පෙරේරා වරලත් මානක විසින් මැන සාදන ලද අංක 1418 සහ 1974.11.10 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් ආර් 2 (මාර්ගය සඳහා වෙන්කළ) දරන කොටසට මායිම් : උතුරට : ලොට් එච්, ජේ, එල් සහ ආර් 3 (අඩි 5ක් පළල කාණුවක් සඳහා වෙන්කළ) ද; නැගෙනහිරට : ලොට් එන් සහ ඕ ද; දකුණට: ලොට් අයි, කේ සහ එම් ද; බස්නාහිරට : ලොට් ආර්1 (අඩි 30ක් පළල මාර්ගය සඳහා වෙන්කළ) ද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම තුනයි හතරක් (පර්. 12.34) විශාල ඉඩම වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු ඒ 1064/263 හි ලියාපදිංචි වී ඇත.

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහා නගර සභා සීමාව තුළ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කොල්ලුපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ අංක 37, කොල්ලුපිටිය පිහිටි ඉසබෙල් කෝර්ට් නැමති ඉඩමට කේ. කිද්නපිල්ලේ වරලත් මානක විසින් සකස් කරන ලද අංක 2420 සහ 1978.11.09 දිනැති පිඹුර ප්‍රකාර ලොට් ඊ (අඩි 20ක් පළල මාර්ගය සඳහා වෙන්කළ) දරන කොටසට මායිම් : උතුරට : ලොට් ඒ, බී, සී, ඩී සහ පිඹුරු අංක 2420 හි ලොට් 4 ද; නැගෙනහිරට : පිඹුරු අංක 2420 හි ලොට් 4, 5 සහ 7 ද; දකුණට : පිඹුරු අංක 2420 හි ලොට් 5, 6, 7 සහ ගාලු පාරේ වරිපනම් අංක 267 ද; බස්නාහිරට : පිඹුරු අංක 2420 හි ලොට් බීසී සහ ගාලු පාර ද, යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් හයයි දශම තුනයි හයක් (පර්. 36.36) විශාල ඉඩම වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු ඊ 09/36 හි ලියාපදිංචි වී ඇත.

**දෙවන උපලේඛනය**

පහත සඳහන් දෑ ඇතුලුව නමුත් ඒවාට පමණක් සීමා නොවූ ඉහත සඳහන් ඉඩමට ස්ථිරව සවි කර ඇති හෝ සවි කර ඇති නිශ්චල කම්හල් යන්ත්‍රෝපකරණ සහ උපකරණ සවිකිරීම්, සවිකෘත සහ ගෘහ භාණ්ඩ සහ වැඩිදියුණු කිරීම් -

උපකරණ සමග විදුලි සැපයුම් පද්ධතිය;
ජල පොම්ප සහ අනෙකුත් උපකරණ ඇතුලුව ජල සැපයුම් පද්ධතිය;
විදුලි සංදේශ උපකරණ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(අයකිරීම්),
මහජන බැංකුව,
අයකිරීම් දෙපාර්තමේන්තුව,
12 වන මහල, පීපල්ස් ටවර්,
අංක 374,
ආචාර්ය කොල්වින් ආර් ද
සිල්වා මාවත.
කොළඹ 02.

2025 දෙසැම්බර් මස 11 වැනි දින.

01 - 50

**කාර්ගිල්ස් බැන්ක් පීඑල්සී (පෙර කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ්) - ආයතනික ශාඛාව**

1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගණුදෙනුකරුගේ නම : තමල්කා ඔෂානි කුරේ සහ අයෙෂින් ඉන්දීවර ප්‍රනාන්දු

ලියාපදිංචි අංක PQ00293614 දරන කාර්ගිල්ස් බැන්ක් පීඑල්සී (ලියාපදිංචි අංක PB 4847 දරන කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් ලෙස පෙර හැඳින්වූ) හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2025.07.11 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම් තමල්කා ඔෂානි කුරේ සහ අයෙෂින් ඉන්දීවර ප්‍රනාන්දු උකස්කරුවන් වශයෙන් කොළඹ 3, ගාලු පාර, අංක 696 හි ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටි කාර්ගිල්ස් බැන්ක් පීඑල්සී (මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) නමට ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2019.07.30 දිනැති අංක 6536 දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රය උකස් කොට බැඳ තබා ප්‍රදානය කරන ලද ණය පහසුකම මත ගෙවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී අංක 6536 දරන උකස් බැඳුම්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් 2025.03.25 දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන්, රුපියල් එක් කෝටි දසලක්ෂ පන්දහස් අටසිය තිස්තුනයි ශත තිස්හත (රු. 11,005,833.37) මුදලක් සහ එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරනු ලබන තෙක් 2025.03.26 දින සිට රු. 10,454,516.63 ක මුදල මත වර්ෂයකට 14.95% ක පොළියක් ද, බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ.

ඒ කෙසේ ද යත්,

එකී අංක 431 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් එක් කෝටි දසලක්ෂ පන්දහස් අටසිය තිස්තුනයි ශත තිස්හත (රු. 11,005,833.37) මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද (ඒ වන විට යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල් අඩු කොට) අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත තමල්කා ඔෂානි කුරේ සහ අයෙෂින් ඉන්දීවර ප්‍රනාන්දු උකස්කරුවන් වශයෙන් උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට හෝමාගම, පනාගොඩ, සර්වෝදය මාවත, හයිලෙවල් පාර, අංක 9-I දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු චන්දිමා ප්‍රියදර්ශනී ගමගේ වෙත වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්ද, පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි අංක 672B, දිග්ගල ග්‍රාම සේවා වසමේ, කෙසෙල්වත්ත පිහිටි දිග්ගල පාර, වරිපනම් අංක 221A සහ 221B හි "කහටගහවත්ත" යන ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ඩී. කේ. ආර්. පී. පාතේගම විසින් මැන සාදන ලද අංක 7411 හා 2019 මැයි මස 22 දින දරන පිඹුරේ කැබලි අංක 1A (මෙය බලයලත් මිනින්දෝරු ඒ. එම්. ආර්. ජයසේකර විසින් මැන සාදන ලද අංක 10361 හා 2015.12.19 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 1 හි නැවත මිණුමකි) දරන කොටසට මායිම් : උතුරට : එකී ඉඩමේ කොටසක්, එම්. කුරේ විසින් හිමිකම් කියන ඉඩම සහ අංක 10361 පිඹුරේ කැබලි අංක 1 සහ නැගෙනහිරට : අංක 2212 පිඹුරේ කැබලි අංක 1 සහ දකුණට: දිග්ගල පාර සහ එකී ඉඩමේ කොටසක් : බස්නාහිරට : එකී ඉඩමේ කොටසක් ද යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් විසි හතරයි දශම තුනයි බිංදුවක් (R:1, P:24.30) හෝ හෙක්ටයාර 0.1626ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, බිම, ගහකොළ, පලතුරු ඇතුළු ඉහත කී අංක 7411 දරන පිඹුරේ සඳහන් සියලු දේ වේ.

බලයලත් මිනින්දෝරු ටී. ඩී. කේ. ආර්. පී. පාතේගම විසින් මැන සාදන ලද අංක 7411 හා 2019 මැයි මස 22 දින දරන පිඹුරේ කැබලි අංක 1A පහත සඳහන් ඉඩමේ නැවත මිණුමකි.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්ද, පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි අංක 672B, දිග්ගල ග්‍රාම සේවා වසමේ, කෙසෙල්වත්ත පිහිටි දිග්ගල පාර, වරිපනම් අංක 221A සහ 221B හි "කහටගහවත්ත" යන ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. ආර්. ජයසේකර විසින් මැන සාදන ලද අංක 10361 හා 2015.12.19 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 1 දරන කොටසට මායිම් : උතුරට : එකී ඉඩමේ කොටසක් සහ මල්ලිකා කුරේ විසින් හිමිකම් කියන ඉඩම සහ නැගෙනහිරට : එම්. එල්. එස්. කුරේගේ අංක 2212 පිඹුරේ කැබලි අංක 1 සහ දකුණට : එම්. එල්. එස්. කුරේගේ අංක 2212 පිඹුරේ කැබලි අංක 1, දිග්ගල පාර සහ එකී ඉඩමේ කොටසක්; බස්නාහිරට : එකී ඉඩමේ කොටසක් ද යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් විසිහතරයි දශම තුනයි හතරක් (R:1, P:24.34ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, බිම, ගහකොළ, පළතුරු ඇතුළු ඉහත කී අංක 10361 දරන පිඹුරේ සඳහන් සියලු දේ වේ. මෙය පානදුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව D268/96 හි වෙනත් කරුණු තීරයෙහි ලියාපදිංචි වී ඇත.

බලයලත් මිනින්දෝරු ඒ. එම්. ආර්. ජයසේකර විසින් මැන සාදන ලද අංක 10361 හා 2015.12.19 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 1 දරන කොටස බලයලත් මිනින්දෝරු එල්. එන්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 2297 හා 1996.12.13 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 1 දරන කොටස සමාන හා නැවත මිණුමකි.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්ද, පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ පානදුර ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පිහිටි අංක 672B, දිග්ගල ග්‍රාම සේවා වසමේ, කෙසෙල්වත්ත පිහිටි දිග්ගල පාර, වරිපනම් අංක 221A සහ 221B හි "කහටගහවත්ත" යන ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. එන්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 2297 හා 1996.12.13 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 1 දරන කොටසට මායිම් : උතුරට : මල්ලිකා කුරේ විසින් හිමිකම් කියන ඉඩම සහ නැගෙනහිරට : එම්. එල්. එස්. කුරේගේ අංක 2212 පිඹුරේ කැබලි අංක 1 සහ දකුණට : දිග්ගල තොටුපල පාර සහ එකී ඉඩමේ කොටසක් සහ බස්නාහිරට : එකී ඉඩමේ කොටසක් ද යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් විසිහතරයි දශම තුනයි හතරක් (රූ.1, පර්. 24.34) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, බිම, ගහකොළ, පලතුරු ඇතුළු ඉහත කී අංක 2297 දරන පිඹුරේ සඳහන් සියලු දේ වේ. මෙය පානදුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වෙළුම/පත්‍රිකාව D268/96 හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

චමිලා අබේසූරිය,
ප්‍රධානී - ණය අයකර ගැනීම්.

01 - 35

## ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි. -** මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

**2026 වර්ෂය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| **ජනවාරි** | 2026.01.02 | සිකුරාදා | 2025.12.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.01.09 | සිකුරාදා | 2025.12.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.01.16 | සිකුරාදා | 2026.01.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.01.23 | සිකුරාදා | 2026.01.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.01.30 | සිකුරාදා | 2026.01.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2026.02.06 | සිකුරාදා | 2026.01.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.02.13 | සිකුරාදා | 2026.01.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.02.20 | සිකුරාදා | 2026.02.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.02.27 | සිකුරාදා | 2026.02.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2026.03.06 | සිකුරාදා | 2026.02.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.03.13 | සිකුරාදා | 2026.02.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.03.20 | සිකුරාදා | 2026.03.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.03.27 | සිකුරාදා | 2026.03.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2026 ජනවාරි මස 02 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.